2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

මාළිගාවත්ත, කොළඹ -10

වැය ශීර්ෂ අංකය : 290

අන්තර්ගතය	පිටු අංක
01. ආයතනික පැතිකඩ	2-4
02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම	5-11
03. 2021 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය	12-18
04. කාර්යසාධන දර්ශක	19-22
05. තිරසර සංවර්ධන අරමුණු **(SDG)** සපුරා ගැනීමේ කාර්යසාධනය	23-24
06. මානව සම්පත් පැතිකඩ	25-28
07. අනුකූලතා වාර්තාව	29-36

01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම

ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් වනුයේ 1979 අංක 59 දරණ ධීවර (විදේශ ධීවර යාත්‍රා) පනත, 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත හා ඒ යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීම, වර්තමාන ප්‍රවණතා සහ ජාත්‍යන්තර සාගර නීති, සම්මුතීන්ට අනුකූලව කළ යුතු සංශෝධන හා නව නියෝග හඳුන්වා දීම යි.

එසේම ධීවර කර්මාන්තයේ සංවර්ධනය උදෙසා නව තාක්ෂණය හඳුන්වාදීම ද, පසු අස්වනු හානිය අවම කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ද, අපනයන හා දේශීය පරිභෝජනය සඳහා වන මත්ස්‍ය නිෂ්පාදනවල තත්ත්වය සහ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීමට අදාල වැඩිදියුණු කිරීම ද, ධීවර කුටුම්භයන්හි සමාජ හා ආර්ථික තත්ත්වය නංවා ගැනීම සඳහා ධීවරයින් සහ ධීවර කාන්තාවන් සඳහා දිරිගැන්වීම් සැපයීම ද ප්‍රමුඛ කාර්යයන් බවට පත්ව ඇත.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

1.2.1. දැක්ම

ධීවර සහ ජලජ සම්පත් තිරසරභාවයෙන් යුක්තව පවත්වා ගනිමින් ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීම හරහා ජාතික ආර්ථිකයට ප්‍රශස්ථ දායකත්වයක් ලබාදීම

1.2.2. මෙහෙවර

ධීවර කර්මාන්තයෙහි තිරසාර සංවර්ධනය හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට ඵලදායී දායකත්වයක් ලබාදීමට ජාතික හා ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව නව තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් ධීවර සහ ජලජ සම්පත් කළමණාකරණය කිරීම

1.2.3. අරමුණු

- දේශීය, ජාත්‍යන්තර සාගර නීති සහ සම්මුතීන්ට අනුකූලව ධීවර කටයුතු කළමණාකරණය, විධිමත් කිරීම, සංරක්ෂණය සහ තිරසාර සංවර්ධනය
- ධීවර ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය ආයෝජන දිරිගැන්වීම
- දේශීය සහ ජාත්‍යන්තර මුහුදේ මත්ස්‍ය සම්පත් නෙලීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම
- ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපනයන මත්ස්‍ය නිෂ්පාදනයන්හි තත්ත්වය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම
- පසු අස්වනු නාස්තිය අවම කිරීම සහ දේශීය මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම
- අන්තර්ජාතික ප්‍රඥප්ති සහ කලාපීය සම්මුතීන්ට අනුකූලව ධීවර මෙහෙයුම් සිදු කරන බවට සහතික වීම
- වරාය රාජ්‍ය පියවරයන් ක්‍රියාත්මක කිරීමේ නියෝග මාලාවට අනුව වරාය සේවා ක්‍රියාත්මක කිරීම
- මහමුහුදේ ධීවර කටයුතුවල යෙදෙන යාත්‍රාවල මෙහෙයුම් අධීක්ෂණය හා ආරක්ෂාව තහවුරු කිරීම
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ජනතාවට හා අනෙකුත් සේවාදායකයින් හට ප්‍රශස්ත සේවාවක් ලබාදීම
- තොරතුරු තාක්ෂණය භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ධීවර ක්ෂේත්‍රයට අදාල දත්ත තොරතුරු කඩිනමින් හා නිරවුල්ව ලබා ගත හැකි වීම

1.3. ප්‍රධාන කාර්යයන්

- ධීවර මෙහෙයුම් නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ධීවර කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ජලජීවී වගා කළමනාකරණ නියෝග සකස් කිරීම, පැනවීම, යාවත්කාලීන කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ධීවර යාත්‍රා ලියාපදිංචි කිරීම, උකස් කිරීම හා ධීවර මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම
- සජීවී මසුන් අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම
- විදේශීය ධීවර යාත්‍රා සඳහා මසුන් ගොඩබෑම පිණිස බලපත්‍ර නිකුත් කිරීම
- ධීවර කළමනාකරණය පිළිබඳ ධීවර ජනතාවගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම
- ප්‍රාග්ධන භාණ්ඩ ලබාගැනීම සඳහා ආයතනික ණය පහසුකම් සම්බන්ධීකරණය
- ධීවර යාත්‍රා නිෂ්පාදන ආයතන ලියාපදිංචි කිරීම, නියාමනය හා අධීක්ෂණය කිරීම
- ධීවර යෙදවුම් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, නියාමනය සහ අධීක්ෂණය කිරීම
- ධීවර සමුපකාර සමිති කාර්යක්ෂම මට්ටමට ගෙන ඒම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීම
- ජාතික ධීවර සම්මේලනය යටතේ පිහිටුවා ඇති ග්‍රාමීය ධීවර සංවිධාන සම්බන්ධීකරණය හා අධීක්ෂණය
- ධීවර කර්මාන්තයට අදාල දත්ත රැස් කිරීම
- විදේශ රටවල් විසින් අත්අඩංගුවට ගැනෙන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- මුහුදේ අතරමං වන ධීවර කාර්මිකයින් හා යාත්‍රා ආපසු ලංකාවට ගෙන්වා ගැනීම
- අපනයන කරනු ලබන මසුන් තත්ත්ව පරීක්ෂණයට භාජනය කිරීම
- මසුන් සකස් කිරීමේ ස්ථාන ලියාපදිංචි කිරීම සහ මත්සය අපනයන සඳහා ස්වස්ථා සහතික නිකුත් කිරීම
- දේශීය පරිභෝජනය සඳහා මසුන් වෙළඳාම් කරන ස්ථානවල තත්ත්වය උසස් කිරීම
- මහ මුහුදේ ධීවර කර්මාන්තයට එක් වූ බහුදින යාත්‍රා සඳහා යාත්‍රා නිරීක්ෂණ උපකරණ සවි කිරීම
- ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවිඩ සන්නිවේදන පහසුකම් ලබාදීම
- දේශසීමාවන් උල්ලංඝනය කරමින් ගමන් කරන ධීවර යාත්‍රා පිළිබඳ වාර්තා ලබා ගැනීම
- දිනපතා කාලගුණ වාර්තා හා අයහපත් කාලගුණික පූර්ව තොරතුරු දෛනිකව ලබා දීම
- යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය මගින් ලබා දෙන තොරතුරු අනුව යාත්‍රා දැනුවත් කිරීම
- අනවසර විදේශීය ධීවර යාත්‍රා හා කාර්මිකයින් පිළිබඳ අදාල ආයතන දැනුවත් කිරීම
- ධීවර යාත්‍රාවල සන්නිවේදන කටයුතු සඳහා බලපත්‍ර හා ඇමතුම් සංඥා ලබාදීමට කටයුතු කිරීම
- ධීවර කාර්මිකයින් හා යාත්‍රාවන් සම්බන්ධ අනතුරුවල දී රක්ෂණය සඳහා තොරතුරු සනාථ කරදීම
- අන්තර්ජාතික මුහුදු සීමාවන්හි පාවීයමින් තිබෙන යාත්‍රා බේරා ගැනීමට කටයුතු කිරීම
- ධීවර පවුල්වල සාමාජිකයන්ගේ වෘත්තීය අධ්‍යාපනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- ධීවර කාර්මික රක්ෂණය හා විශ්‍රාම වැටුප් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම මගින් ධීවර සමාජ ආරක්ෂණය
- කලපු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ධීවර ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය
- ධීවර කාන්තාවන් සඳහා විකල්ප ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

1.4. සංවිධාන සටහන

ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ ජනරාල්වරයකු මගින් පාලනය වේ. එම කටයුතු වඩාත් සඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු ද පත්කර ඇත. දෙපාර්තමේන්තුවේ කාර්යයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීමේ පහසුව සලකා ප්‍රධාන කාර්යාලයේ කටයුතු අංශ 09 කට බෙදා වෙන්කර තිබේ.

එනම්,

1. ධීවර කළමනාකරණ අංශය
2. ධීවර සංවර්ධන අංශය
3. ධීවර නිෂ්පාදන තත්ත්ව පාලන අංශය
4. ධීවර මෙහෙයුම් අංශය
5. විමර්ශන හා පුහුණු අංශය
6. තොරතුරු තාක්ෂණ අංශය
7. පාලන අංශය
8. ගිණුම් අංශය
9. අභ්‍යන්තර විගණන අංශය

මෙම අංශවල කටයුතු මෙහෙයවීම අධ්‍යක්ෂවරුන් හත්දෙනෙකු, ප්‍රධාන ගණකාධිකාරී හා ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් ඉටුවේ.

දිවයිනේ මුහුදුබඩ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික් ධීවර සහකාර අධ්‍යක්ෂ කාර්යාල 15ක් පිහිටුවා තිබෙන අතර එක් එක් දිස්ත්‍රික්කයේ කටයුතු එම දිස්ත්‍රික් ධීවර නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරයාගේ මෙහෙයවීම යටතේ ඉටුවේ.

දිස්ත්‍රික්ක තුළ මුහුදුබඩ ප්‍රදේශ ආවරණය වන පරිදි ධීවර පරීක්ෂක කොට්ඨාශ 148ක් පිහිටුවා ඇත. මෙම සෑම ධීවර පරීක්ෂක කොට්ඨාශයක ම ධීවර පරීක්ෂක කාර්යාලය බැගින් ස්ථාපිත කර ඇත. ධීවර පරීක්ෂක, ධීවර සමාජ සංවර්ධන සහකාර, ධීවර සම්පත් කළමනාකරණ සහකාර, සංවර්ධන නිළධාරී සහ ධීවර නිලධාරී යන නිළධාරීන් විසින් මෙම ධීවර පරීක්ෂක කොට්ඨාශ තුළ සියලු ධීවර කටයුතු ක්‍රියාත්මක කෙරේ.

එසේම, ධීවර වරායන් ආශ්‍රිතව ප්‍රාදේශීය සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන 20ක් පිහිටුවා ඇති අතර ගුවන් විදුලි නිලධාරීන් දිවා රාත්‍රී මෙම මධ්‍යස්ථානවල සේවයේ යොදවා ඇත. මෙම ප්‍රාදේශීය සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන මගින් මහමුහුදේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර යාත්‍රා හා ගොඩබිම අතර ගුවන් විදුලි පණිවුඩ හුවමාරු සම්බන්ධතාවය පැය 24 පුරා තබා ගැනීමට කටයුතු කර ඇත. එමගින්, යාත්‍රා සඳහා කාලගුණ වාර්තා හා හදිසි පූර්ව අනතුරු ඇඟවීම් ද දෛනිකව ලබා දෙන අතර යාත්‍රා හිමියන්ගේ පණිවුඩ ලබා දීම හා ධීවර කාර්මිකයින්ගේ පණිවුඩ ලබා ගැනීම් ද සිදු කරනු ලබයි. තවද, ධීවර යාත්‍රාවලින් ලැබෙන හදිසි ආපදා පණිවුඩ සඳහා එම අවස්ථාවේ සිට එම කාර්යය අවසන්වන තෙක් අවශ්‍ය සියළු කටයුතු සිදුකරනු ලබයි. මෙම සියළු කාර්යයන් කොළඹ ප්‍රධාන කාර්යාලයේ පිහිටි සෝදිසි මෙහෙයුම් මැදිරිය විසින් සම්බන්ධීකරණය කරනු ලබයි.

ඊට අමතරව, දිස්ත්‍රික්ක 07ක පිහිටි ධීවර වරායන් 15ක වරාය කාර්යාල පිහිටුවා ඇති අතර ධීවර පරීක්ෂක සහ සංවර්ධන නිළධාරී යන නිළධාරීන් විසින් දිවා රාත්‍රී වරායෙන් පිටත්වන යාත්‍රා පරීක්ෂා කිරීම, පිටත්වීම ලියාපදිංචිය හා අවසර ලබා දීම, වරායට පැමිණෙන ධීවර යාත්‍රා ගමන් වාරයට අදාල ලොග් සටහන ලබා ගැනීම, ඒ අනුව මත්ස්‍ය අස්වැන්න පරීක්ෂාව, අපනයනයට නියමිත මත්ස්‍ය තොග සඳහා වාර්තා සකස් කර ගැනුම්කරුවන්ට ලබා දීම, නීති විරෝධී, වාර්තා නොවූ හා අවිධිමත් ධීවර කටයුතු සිදු වී තිබේ නම් ප්‍රකාශ ලබා ගැනීම හා ලොග් සටහන් හා ලබා ගත් ප්‍රකාශ ෆැක්ස් හා ඊමේල් මගින් ප්‍රධාන කාර්යාලය වෙත ලබා දීම සහ විකල්ප නිරීක්ෂණ වාර්තා සකස් කිරීම ආදී කටයුතු සිදු කෙරේ.

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. විශේෂ ජයග්‍රහණ

1. යාත්‍රා නිරීක්ෂණ උපකරණ සම්බන්ධ පවත්නා නීතිවලට අනුකූල වීම සම්බන්ධව 2021 වසර තුල

යාත්‍රා පිටත්වීම අවලංගු කිරීම (Departure cancel)	138
නීතිමය පියවර ගැනීම සඳහා යොමු කිරීම	28

2. 2021 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා 14 (අ) සහ 14 (ඊ) වගන්ති උල්ලංඝනය කිරීම සම්බන්ධ ප්‍රගතිය

කළ වරද	විමර්ශන ආරම්භ කරන ලද ප්‍රමාණය	විමර්ශන අවසන් කරන ලද ප්‍රමාණය	විමර්ශන අවසන් නොවූ ප්‍රමාණය	අධිකරණයේ නඩු පැවරීම්	පරිපාලන මණ්ඩලයට / සමථකරණයට යොමුකළ ප්‍රමාණය	දඩ ගෙවීම (රු.)
වෙනත් රටක ධීවර මෙහෙයුම් සිදු කිරීම	33	33	-	13	22	126,66666.00
බලපත්‍ර රහිත ධීවර මෙහෙයුම්	21	21	21	21	21	7,500,000.00
ලොග් දඩ සම්බන්ධ	-	-	-	01	-	25,000.00

3. ධීවර හා ජලජ සම්පත් පනත යටතේ සාදන ලද නියෝග 02 ක් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇත

   - 2019 නියමුවන් (දේශීය ධීවර බෝට්ටු) සඳහා ප්‍රවීණතා සහතික නිකුත් කිරීමේ නියෝග
   - 2017 මසුන් හා ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හා ප්‍රති අපනයනය කිරීම කළමනාකරණය කිරීමේ නියෝග (සංශෝධන)

4. ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධනය කිරීමේ කෙටුම්පත් 02ක් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීම සඳහා ඉදිරිපත් කර ඇත

   - 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම
   - 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධනය ට්‍රෝලිං බිම් හඳුන්වාදීම

5. ධීවර හා ජලජ සම්පත් පනත යටතේ සාදන ලද නියෝග සහ නියමයන් 04ක් කෙටුම්පත් කර ඇත.

   - 1984 මාදැල් නියෝග සංශෝධනය කිරීම (කලමැටිය ධීවර වරාය සම්බන්ධව)
   - නිල් පිහිණුම් ඛකුළුවන් පිළිබඳ ධීවර කළමණාකරන නියෝග
   - 2021 ශ්‍රී ලංකා ජල තීරයේ කරමල් දැල් භාවිතා කරමින් මසුන් ඇල්ලීමේ නියෝග
   - කෘතිම උපස්ථර මත වගා කරන ලද කොරල් විශේෂ ආනයනය සහ අපනයනය කිරීමේ නියෝග

6. අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පලකරන ලද නියෝග සහ නියමයන්

- 2017 මසුන් හා ධීවර නිෂ්පාදන අපනයනය කිරීම, ආනයනය කිරීම හා ප්‍රති අපනයනය කිරීම කළමනාකරණය කිරීමේ නියෝග (සංශෝධන)
- ධීවර ගාස්තු (අය කිරීමේ නියෝග) - 2021
- නන්දිකඩාල් කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරන ලද නියමය
- පානකල කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරන ලද නියමය
- පානම කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරන ලද නියමය
- ලංකා පටුන - උල්ලක්කාලි (ඉලන්කයිතුරායි මුගතුවරම්) ධීවර කළමනාකරණ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරන ලද නියමය
- වලෙයි කලපුව ධීවර කළමණාකරන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරන ලද නියමය
- නයාරු කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරන ලද නියමය
- නාසිවන්තීවු කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශ කරන ලද නියමය

7. ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධනය කිරීමේ කෙටුම්පත් 05ක් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

- විනෝද කටයුතු පිළිබඳ මසුන් ඇල්ලීමේ කර්මාන්තය කළමනාකරණය කිරීමේ නියෝග
- ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීමේ නියෝග - 1980 (සංශෝධන)
- ධීවර හැඳුනුම්පත් නිකුත් කිරීමේ නියෝග - 2021
- යාන්ත්‍රික ධීවර බෝට්ටු පිටත් කිරීම සහ පැමිණීමේ නියෝග
- ශ්‍රී ලංකා ජල තීරයේ සහ මහ මුහුදේ ධීවර මෙහෙයුම්වල යෙදෙන ධීවර බෝට්ටු චන්ද්‍රිකා දත්ත මඟින් හා වෙනත් ඉලෙක්ට්‍රොනික් උපාංග මඟින් අධීක්ෂණය කිරීමේ පද්ධතිය (VMS) ක්‍රියාත්මක කිරීමේ නියෝග -2015 (සංශෝධන)

8. කෙටුම්පත් කරන ලද පනත්

- 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම, නීති විරෝධී කටයුතු හා නීති විරෝධී කටයුතු සම්බන්ධයෙන් හා ඒ පිළිබඳ විධිවිධාන ඇතුලත් කිරීම හා බලයලත් නිළධරයන්ගේ කටයුතු බලතලවලට එරෙහිව කටයුතු කර ඇති දණ්ඩනය වැඩි කිරීම

9. ධීවර හා ජලජ සම්පත් පනත යටතේ කෙටුම්පත් කරන ලද නියෝග

- 2014 අංක 01 දරන මහ මුහුදේ ධීවර මෙහෙයුම් නියෝග (සංශෝධනය)
- මසුන් බෙදා හැරීම සහ පරිහරණය කිරීමේ නියෝග
- ධීවර සමිති ව්‍යවස්ථාගත කිරීම

10. පාර්ලිමේන්තුව සම්මත කරන ලද නියෝග

- ධීවර (ගාස්තු පැනවීමේ) නියෝග

11. මුහුදු ආහාර අපනයනය සඳහා නිකුත් කරන ලද බලපත්‍ර ගණන

- විසිතුරු මසුන් අපනයනය 1557
- හක්බෙල්ලන් අපනයනය 45
- මුහුදු කූඩැල්ලන් අපනයනය 142
- මුහුදු ආහාර අපනයනය සඳහා ස්වස්ථතා සහතික සංඛ්‍යාව 41163

- මසුන් ඇල්ලීමේ සහතික සංඛ්‍යාව 28805
- මත්ස්ය නිෂ්පාදන පිරිසැකසුම් ආයතන ලියාපදිංචි සංඛ්‍යාව 50
- මත්ස්‍ය ඇසුරුම් මධ්‍යස්ථාන ලියාපදිංචි සංඛ්‍යාව 14

12. තොරතුරු තාක්ෂණික ප්‍රගතිය

- ධීවර හැදුනුම්පත් 6000ක් පමණ 100% දෙපාර්තමේන්තුවේ සම්පත් පමණක් උපයෝගී කරගෙන මුද්‍රණය කිරීම
- ශ්‍රී ලංකාවේ හොඳම වෙබ් අඩවි තෝරා ගැනීමට පවත්වනු ලබන Bestweb.lk තරගාවලියේ දී දෙපාර්තමේන්තු වෙබ් අඩවියට සිංහල වෙබ් අඩවි අංශයෙන් පළමු ස්ථානය ද රජයේ වෙබ් අඩවි අංශයෙන් විශේෂ සම්මානයක් ද ලබා ගැනීමට හැකි වීම
- ජාලගත මෘදුකාංය (MSDFAR) භාවිතයෙන් රාජකාරී සිදු කිරීම ආරම්භ කර ඇති අතර මේ වන විට සාර්ථකව එමගින් ධීවර ලියාපදිංචි කිරීම් (Fishermen Registration) 45265, යාත්‍රාංගන ලියාපදිංචි කිරීම් (Yard Registration) 166, යාත්‍රා සැලසුම් අනුමත කිරීම් (Boat Design) 1535, බෝට්ටු අංක ලියාපදිංචි කිරීම් (Boat Number Registration) 6950, යාත්‍රා ලියාපදිංචි කිරීම් (Boat Registration) 4590, යාත්‍රා අලුත් කිරීම් (Boat Renewal) 4485, මෙහෙයුම් බලපත්‍ර නිකුත් කිරීම් (Operation license) 5520, මෙහෙයුම් බලපත්‍ර අලුත් කිරීම (Operation license Renewal) 870, විද්‍යාත්මක දත්ත ඇතුලත් කිරීම් (Scientific Data) 1600, නියමු ලියාපදිංචිය (Skipper license) 779, මත්ස්‍ය ඇල්ලුම් සහතිකය (Catch Certificate) 5ක් පමණ සිදු කිරීමට හැකි වී තිබීම
- දෙපාර්තමේන්තුවේ නව පරිගණක 40කට පමණ විවෘත කේත (Open Source) මෙහෙයුම් පද්ධති හඳුන්වා දීම

13. විදේශීය රටවල දී අත්අඩංගුවට පත් ධීවරයින් හා යාත්‍රා මුදා ගැනීම හා මෙරටට ගෙන්වා ගැනීම

අත්අඩංගුවට පත් ධීවරයින් සංඛ්‍යාව	මුදාගත් ධීවරයින් සංඛ්‍යාව	අත්අඩංගුවට පත් යාත්‍රා සංඛ්‍යාව	මුදාගත් යාත්‍රා සංඛ්‍යාව
156	113	24	18

14. දේශීය, ජාත්‍යන්තර හා විදේශ රටවලට අයත් මුහුදු සීමාවන්හි පාවී යමින් තිබෙන යාත්‍රා බේරා ගැනීම

මුදාගත් ධීවරයින් සංඛ්‍යාව	මුදාගත් යාත්‍රා සංඛ්‍යාව	අත්හැර දමන ලද යාත්‍රා සංඛ්‍යාව
303	63	07

15. මහ මුහුදේ ධීවර මෙහෙයුම් සිදුකරන යාත්‍රා වල තොරතුරු සත්‍යාපනය කිරීම

1.	මහ මුහුදේ මෙහෙයුම්වලට අදාලව ඒකකය වෙත ලැබුණු ලොග් පිටපත් ගණන	2157
2.	මෙහෙයුම්වලට අදාලව නිකුත් කරන ලද සත්‍යාපන වාර්තා ගණන	2157
3.	ලොග් දත්ත ගබඩාව වෙත ඇතුළු කරන ලද ලොග් පිටපත් ගණන	41076

16. තොරතුරු තාක්ෂණය භාවිතයෙන් සේවා සැපයීමේ ප්‍රගතිය

1.	මාර්ග ගත ක්‍රමයට යාත්‍රා සඳහා ගමන්වාර ලබා දීම	61451
2.	AIS උපකරණ නිත්‍යානුකූලව ලියාපදිංචි කිරීම	8790
3.	IOTC අවශ්‍යතා සඳහා පවත්වා ගන්නා යාත්‍රා ජායාරූප වාර්තා ගණන	3072

17. ධීවර කාර්මිකයින් (ධීවර යාත්‍රා වල) සුරක්ෂිතතාවය තහවුරු කිරීම

- රක්ෂණය කරන ලද සමස්ථ ධීවර යාත්‍රා සංඛ්‍යාව - 21058 (3 කාර්තුවට අදාලව)
- රක්ෂණය කරන ලද සමස්ථ ධීවර කාර්මිකයින් සංඛ්‍යාව - 33269 (3 කාර්තුවට අදාලව)
- ධීවර විශ්‍රම වැටුප් යෝජනා ක්‍රමයට දායකවූ සංඛ්‍යාව - 388 (3 කාර්තුවට අදාලව)
- මුහුදු යෝග්‍යතා සහතික නිකුත් කිරීම් සංඛ්‍යාව - 17829 (3 කාර්තුවට අදාලව)

ස්වාභාවික විපත් සඳහා වන්දි ලබා දීම

මෙම වැඩසටහන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ ජාතික රක්ෂණාගාර අරමුදල සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා ප්‍රතිලාභියාගෙන් අයකිරීමක් සිදුනොකරයි. මේ යටතේ ධීවර කටයුතුවල යෙදී සිටියදී සිදුවන ස්වාභාවික විපත් හේතුවෙන් මියයන ධීවර කාර්මිකයෙකු වෙනුවෙන් ඔහුගේ යැපෙන්නන්ට රුපියල් මිලියනයක රක්ෂණාවරණයක් ලබා දෙනු ලබයි. 2021 වසර තුල ප්‍රතිලාභී පවුල් 6ක් සඳහා රක්ෂණ වන්දි ලබා දී ඇත.

ධීවර සුරැකුම් රක්ෂණය

2019 වසරේ දී ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණයෙන් පෞද්ගලික රක්ෂණ සමාගමක් සමඟ මෙය ආරම්භ කරන ලද අතර එහි වාර්ෂික වාරික මුදල රු.1348.00ක් වේ.එමගින්, ධීවර කාර්මිකයින්ගේ හදිසි අනතුරු මරණයකදි පවුලේ සමාජිකයින් සඳහා රු.මිලියනයක් සහ ස්වාභාවික මරණයක දී රු.250,000.00 රක්ෂණාවරණ මුදලක් ලබා දේ. දැනට එම රක්ෂණාවරණය සඳහා ප්‍රතිලාභීන් 450කට පමණ වන්දි ලබා දී ඇත.

වෙරළාසන්න මුහුදු තීරයේ මත්ස්‍ය ගහනය වැඩි කිරීම සඳහා භාවිතයෙන් ඉවත් කළ වාහන භාවිතයෙන් ඇටවුම් යෙදවීම

2021 වර්ෂය සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු අයවැය ප්‍රතිපාදන යටතේ වෙරළාසන්න මුහුදේ පරිසර පද්ධති වැඩිදියුණු කිරීම සඳහා මිලියන 10ක් ද ,ධීවර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ වෙරළබඩ ප්‍රදේශයේ මත්ස්‍ය ගහණය වැඩි කිරීම සඳහා වාසස්ථාන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ මිලියන 20.2ක් ද වෙන් වී ඇත. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 30.2කි.

වෙරළාසන්න මුහුදේ මත්ස්‍ය ගහනය වැඩි කිරීමේ අරමුණින් භාවිතයෙන් ඉවත් කළ බස්රථ, හා අබලි ධීවර යාත්‍රා යොදා ගනිමින් වෙරළාසන්න මුහුදේ කෘතිම මත්ස්‍ය වාසස්ථාන ඇති කිරීමේ ව්‍යාපෘතිය ගාල්ල, මාතර නිල්වැල්ල සහ යාපනය ප්‍රදේශවල වෙරළාසන්න මුහුදේ 2021 වසරේ අයවැය ප්‍රතිපාදන යටතේ සිදු කරන ලදී.

ගාල්ල ප්‍රදේශයේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය සඳහා බස් රථ 24ක් ද, දෙවන අදියර ලෙස මාතර නිල්වැල්ල මුහුදු කෞතුකාගාරය නාවික හමුදාව හා ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කල අතර ඒ සඳහා දෙපාර්තමේන්තුව විසින් එක් බස් රථයක් ද තුන්වන අදියර ලෙස යාපනය කරයිතිව් දුපත් ආශ්‍රිතව බස් රථ 38ක් යොදාගෙන සිදු කරන ලදී.

අදාල බස්රථ මිල තීරණය කිරීම, ප්‍රවාහන අමාත්‍යාංශ කමිටුවක් මගින් තීරණය කරන ලද අතර අදාල බස් රථ ගොඩබිම් ප්‍රවාහන සඳහා ද වියදම එකතු කිරීම සිදුකරන අතර පූර්ව ඇස්තමේන්තු ලබාගැනීමක් සිදු කල නොහැකි අතර ව්‍යාපෘති බිම වෙත යෙදවුම් ප්‍රවාහනය එකඟ වූ මිලගණන් යටතේ සයුර කැණීම් යාත්‍රාව සඳහා ගෙවීම් බිල්පත් අදාල මෙහෙයුම් සිදු කිරීමෙන් පසු ගත වූ කාලය අනුව ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය යටතේ සිදු කරන ලදි.

ඒ අනුව, අප වෙත ලැබී ඇති සමස්ථ වියදම් බිල්පත්වල වටිනාකම රුපියල් 29,398,906කි. 2021 වර්ෂයේ මෙම රුපියල් මිලියන 29.39ක බිල්පත්, දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් පියවා ඇත.

18. කරවල නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන තෝරාගත් කාන්තාවන් සඳහා තත්ත්වයෙන් උසස් නිෂ්පාදනයක් සඳහා අවශ්‍ය උපකරණ ලබාදීමේ නියමු ව්‍යාපෘතිය

2021 ධීවර අමාත්‍යාංශයෙන් ලබා දෙන ධීවර ප්‍රජාව බලගැන්වීම ශීර්ෂය යටතේ ධීවර කාන්තා සමිති සාමාජිකයන් ශක්තිමත් කිරීම සඳහා ලබාදෙන ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 4ක් තොරාගත් දිස්ත්‍රික්කවල නියමු ව්‍යාපෘතියක් ලෙස කරවල නිෂ්පාදනයේ යෙදෙන කාන්තාවන් සඳහා අවශ්‍ය උපකරණ කට්ටල ලබා දීම යෝජනා කෙරනු අතර එම මුදල ප්‍රමාණවත් නොවන බැවින් සාගර විශ්වවිද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට වෙන් කර තිබූ රුපියල් මිලියන 8 මගින් රුපියල් මිලියන 2.5 ක ප්‍රතිපාදන මුදලක් මෙම ව්‍යාපෘතිය වෙත අමතරව ලබා දී ඇත.ඒබැවින් මෙම ව්‍යාපෘතිය වෙත ලැබී ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 6.5 කි.

ඒ අනුව පහත සඳහන් උපකරණ කට්ටලය බැගින් ලබාදීමත් ව්‍යාපෘති වාර්තාවේ සඳහන් කර ඇති ක්‍රමවේදයන්ට අනුව දිස්ත්‍රික් වලින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කරන ලදි.

උපකරණ	ප්‍රතිලාභීන්
සීනෝර් ආයතනයේ නිෂ්පාදිත කරවල වේලන මේසය ප්ලාස්ටික් බැරල් 1(250L) පිහි 2 (දිග 8- තලය 5” පළල 2” මිට 3” දිග 10- තලය 6“පළල 3”මිට 4 ”)	යාපනය 30 මන්නාරම 10 මීගමුව 10 මාතර 20

ඒ අනුව ඉහත සඳහන් උපකරණ අදාල දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදා හැරීම සිදුකර ඇත.

19. මත්ස්‍ය පසු අස්වනු හානිය අවම කිරීම සඳහා පහසුකම් සැලසීම

වර්තමානයේ දී, ශ්‍රී ලංකාවේ සමස්ථ මත්ස්‍ය නිෂ්පාදනයෙන් දේශීය වෙළෙඳපොළ සඳහා 70%ක දායකත්වයක් ද, අපනයන වෙළඳපොළ සඳහා 7%ක දායකත්වයක් ද ලැබේ. එසේම, නිවැරදි පරිහරණය ක්‍රමවේදය භාවිත නොකිරීම හේතුවෙන් මත්ස්‍ය නිෂ්පාදනයෙන් දළ වශයෙන් 20% -30% අතර වූ පසු අස්වනු හානියක් සිදුවන බවට ගණනය කර ඇත. මෙම පසු අස්වනු හානිය අවම කරමින් ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ මත්ස්‍ය නිෂ්පාදන වෙළඳපොළට ලබා දීම සඳහා නිවැරදි පරිහරණය ක්‍රමවේද පිළිබඳ දැනුවත් කිරීම මෙන්ම, ධීවරයින් සඳහා අවශ්‍ය පහසුකම් ද ලබා දීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
මේ සඳහා රුපියල් මිලියන 8ක ප්‍රතිපාදන වෙන් විය. මිට අමතරව, රුපියල් මිලියන 0.5ක් සාගර විශ්වවිද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට වෙන් කර තිබූ රුපියල් මිලියන 8න් වෙන් කර දී ඇති අතර, රුපියල් මිලියන 1ක්

අක්‍රීය තත්ත්වයේ පවතින ධීවර සමුපාකාර සමිති 300ක් ප්‍රතිසංවිධානය කිරීමට වෙන් කර තිබූ රුපියල් මිලියන 6න් ලබා දී ඇත. ඒ අනුව, ව්‍යාපෘතිය සඳහා වෙන් වූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 9.5 වේ.

ඒ අනුව, ඇසුරුම් පෙට්ටි වල වටිනාකමින් 25 % ක ප්‍රජා දායකත්වය ලබා ගැනීමට යටත්ව අදාල මුදලින් ලබා ගත හැකි උපරිම ඇසුරුම් පෙට්ටි ප්‍රමාණය මිලදී ගැනීමටත්, අදාල ව්‍යාපෘති යෝජනාවේ ඇති c/ppr (14) 2016 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව සී/ස සිනොර් පදනමෙන් මිලදී ගැනීම් සිදු කරන ලදී. කෙසේ වෙතත්, අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතාවය හේතුවෙන් සිනෝර් වෙතින් උපරිම ඇසුරුම් පෙට්ටි 49ක් පමණක් 2021 වර්ෂය තුළ ලබා දුන් අතර එය පළමුව 25% ප්‍රජා දායකත්වය ලබා දුන් 49 දෙනා සඳහා ප්‍රදානය කරන ලදි.

20. වෙරළාසන්න ධීවර මත්ස්‍ය බිම් 10 ක් සඳහා FAD සවි කිරීම

වෙරළාසන්න මුහුදේ මත්ස්‍ය ගහණය ඉහළ නැංවීම සඳහා කොන්ක්‍රීට්වලින් සැකසූ කෘත්‍රිම ව්‍යුහයන් යොදමින් මසුන් ඒකරාශී වීමේ ඇටවුම් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 10ක ප්‍රතිපාදන මුදලක් වෙන් වූ අතර, මේ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව ප්‍රසම්පාදන සිදු කර රාජ්‍යය ඉංජිනේරු සංස්ථාවට 2021.12.10 දින ලංසු ප්‍රදානය කල අතර දින 14ක් ඇතුලත වැඩ ආරම්භ කිරීමට දැනුම් දෙන ලදී.

21. කලපු මත්ස්‍ය ගහණය ඉහළ නැංවීම

රුපියල් මිලියන 2.2ක ප්‍රතිපාදන වැයකර යාපනය දිස්ත්‍රික්කයේ තොන්ඩමන් ආරු කලපුවේ කරඇඩු ඉස්සන් පැටවුන් මිලියන 4ක් හා රු.මිලියන 0.825ක ප්‍රතිපාදන වැය කර මඩකලපුව කලපුවේ කරඇඩු ඉස්සන් පැටවුන් මිලියන 1.5ක් තැන්පත් කර ඇත. දැනට තොන්ඩමන් ආරු කලපුව තුලින් ප්‍රතිලාභීන් 465ක් සහ මඩකලපුව කලපුව තුලින් ප්‍රතිලාභීන් 500ක් හඳුනාගෙන ඇත.

22. මෝදා මත්ස්‍ය වගාව

පුත්තලම කලපුවේ මෝදා මත්ස්‍ය කූඩුවල මෝදා මත්ස්‍ය පැටවුන් 27500ක් තැන්පත් කර ඇත.

23. කලපු සංවර්ධනය

- **කලපු සීමා නිර්ණය කිරීම**

කලපු සීමා නිර්ණය කිරීම සඳහා රුපියල් මිලියන 11ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර මෙතෙක් අරුගම්බේ, ලංකා පටුන, හලාවත, මුන්දලම, රැකව සහ කෝකිලායි යන කලපු වල සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් මායිම් කණු 5288ක් සිටුවා ඇත.

- **කලපු පිරිසිදු කිරීම හා ගැඹුරු කිරීම**

මුලතිව් දිස්ත්‍රික්කයේ නන්දිකඩාල් කලපුවේ ධීවර කර්මාන්තය ආශ්‍රිත සංවර්ධන කටයුතු සම්බන්ධව ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනය විසින් මූලික පාරිසරික ඇගයීම් වාර්තාවක් සකස් කර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. මෙහි පළමු තාක්ෂණික කමිටු රැස්වීම පවත්වා ඇත. නයාරු කලපුවේ ධීවර කර්මාන්තය ආශ්‍රිත සංවර්ධන කටයුතු සම්බන්ධ වාර්තාව ජාතික ජලජ සම්පත් පර්යේෂණ නියෝජිතායතනය සකස් කර අවසන් කර ඇත.

- **කලපු කළමණාකරණය**

කෝකිලායි කලපුවේ කලපු කළමණාකරණ කමිටු 15ක් ප්‍රතිසංවිධානය කර ඇත.

24. යටිතල පහසුකම් සංවර්ධනය

යාපනය සහ මාතර දිස්ත්‍රික්කවල ව්‍යාපෘති 31ක් සඳහා රු. මිලියන 29.98ක ප්‍රතිපාදන නිදහස් කර ඇත.

2.2. අභියෝග

1. සියලු නිලධාරීන්ට ස්ථායී අන්තර්ජාල පහසුකම් ලබා දීමට නොහැකි වීම
2. ඇතැම් නිලධාරීන්ගේ නව තාක්ෂණය භාවිතයට ඇති පසුගාමීත්වය
3. නිලධාරීන්ට ලබා දී ඇති සැලකිය යුතු ටැබ් යන්ත්‍ර සංඛ්‍යාවක් නිසි ලෙස ක්‍රියාත්මක නොවීම
4. පවතින කොරෝනා වසංගතය හේතුවෙන් නිලධාරීන්ට රාජකාරී කටයුතු කිරීමේ අපහසුතාව

2.3.ඉදිරි ඉලක්ක

1. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා මෙහෙයුම් පද්ධතියක් හදුන්වා දීම
2. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා මූලික පරිගණක දැනුම ලබා දීම
3. ධීවරයින් 15000ක් සඳහා විද්‍යුත් හැඳුනුම්පතක් හදුන්වා දීම
4. ගමන් වාර 10000ක වෙනුවෙන් ධීවරයින් සඳහා ඊ-ලොග් යෙදුම ක්‍රියාත්මක කිරීම
5. දත්ත විශ්ලේෂණය සඳහා R සංඛයාන භාෂාව හදුන්වා දීම
6. ඉන්වෙන්ට්‍රි කළමනාකරණ පද්ධතිය හදුන්වා දීම

03. පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන

සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

2021.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021		සටහන	තත්‍ය 2021	2020	
-	ආදායම් ලැබීම්		64,606,538	43,562,801	
-	ආදායම් බදු		-	-	
52,000,000.00	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	64,606,538	43,562,801	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
52,000,000.00	මුළු ආදායම් ලැබීම් (අ)		**64,606,538**	**43,562,801**	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		573,350,000	730,183,000	ඒසිඒ-3
-	තැන්පතු		90,955,567	41,355,220	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		25,827,415	22,264,578	ඒසිඒ-5/5(ඒ
-	වෙනත් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**690,132,982**	**793,802,798**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**754,739,520**	**837,365,599**	
	භාණ්ඩාගාර ප්‍රේෂණ (ඇ)		**-**	**-**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ=(ඇ)-(ඈ)		**754,739,520**	**837,365,599**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		**-**	**-**	
481,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	478,469,247	439,220,420	
102,200,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	125,584,942	96,206,556	
68,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	89,164,831	209,906,037	ඒසිඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	
800,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	291,865	-	
653,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**693,510,884**	**745,333,013**	

	මූලධන වියදම්				
58,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	19,038,819	11,697,941	
28,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	16,574,347	17,152,913	ඒසිඒ- 2(ii)
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	24,215,000	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,500,000	හැකියා වර්ධනය	**14**	1,008,204	966,535	
19,500,000	වෙනත් මූලධන වියදම්	**15**	9,464,704	18,466,230	
107,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**46,086,075**	**72,498,619**	
	තැන්පතු ගෙවීම්		50,840,892	35,244,629	ඒසිඒ- 4
	අත්තිකාරම් ගෙවීම්		17,319,666	15,802,039	ඒසිඒ- 5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්				
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**68,160,558**	**51,046,668**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**807,757,517**	**868,878,300**	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ= (ඉ-එ)		**(53,017,997)**	**(31,512,701)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		53,017,997	-	ඒසඒ- 7
-	**දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය**		(0)	-	ඒසිඒ- 8

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,069,868,735	778,299,720
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	74,868,092	83,375,840
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**1,144,736,827**	**861,675,560**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		(19,601,070)	29,021,354
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,069,868,735	778,299,720
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	94,469,162	54,354,486
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**1,144,736,827**	**861,675,560**

පිටු අංක..07....සිට ..37... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..38.... සිට ..50... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 23/02/22	දිනය :	දිනය : 2022/02/22
ආර්.එම්.අයි. රත්නායක ලේකම් ධීවර අමාත්‍යාංශය 02 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ - 10.	සුසන්ත කහවත්ත අධ්‍යක්ෂ ජනරාල් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	ඒ.ජ.එම්. දිල්හානි ප්‍රධාන ගණකාධිකාරි ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, මාලිගාවත්ත, කොළඹ 10.

3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය **ඒසීඒ-සී**

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021	**2020**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	64,606,538	43,562,801
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර ලාභ		
ආදායම් නොවන ලැබීම්	-	2,278,945
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම	56,924,943	39,677,867
අග්‍රිම ලැබීම්	573,350,000	730,183,000
අත්තිකාරම් අයකර ගැනීම්	22,477,692	16,985,553
තැන්පතු ලැබීම්	90,955,567	41,355,220
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**808,314,740**	**874,043,387**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	591,115,241	528,024,503
සහනාධාර සහ මාරුකිරීම්	82,229,303	209,272,800
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම්	35,221,114	14,206,784
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	2,278,945
අත්තිකාරම් ගෙවීම්	12,809,200	10,319,377
තැන්පතු ගෙවීම්	50,840,892	35,244,629
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**772,215,751**	**799,347,038**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	36,098,989	74,696,349
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	36,098,989	74,696,349

ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**36,098,989**	**74,696,349**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(36,098,989)	(74,696,349)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) +(ඒ)	(0	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශය ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කල මුදල් පදනම මත සිදු කරයි.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාල අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකිනම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථා වලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණ වල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2021 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.6. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු.)	සංශෝධිත ඇස්තමේන්තුව (රු.)	ප්‍රමාණය (රු.)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
10.03.07.06	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට අදාල බලපත්‍ර ගාස්තු	52,000,000	43,000,000	64,606,538	150.2

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදනය		තත්‍ය වියදම	උපයෝගී කරන ලද ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	653,000,000	704,219,000	693,510,884	**98**
ප්‍රාග්ධන	107,000,000	107,000,000	46,086,075	**43**
	760,000,000	**811,219,000**	**739,596,959**	**91.2**

3.8 මු.රෙ.208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට පුදානය කරනු ලබන ප්‍රතිපාදන

රු. ,000

